## 01. දකුණු පළාත් සභාවේ 1989 අංක 02 දරන (දුගී දුප්පත්කම දුරලීමේ අරමුදල) ප්‍රඥප්තිය.

දකුණු පළාතේ ස්වයං රැකියා උත්පාදනය හා වෙනත් සංවර්ධන අරමුණු තුළින් දුගී දුප්පත්කම තුරන් කරලීම සඳහා විධි විධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**01**.මෙම ප්‍රඥප්තිය 1989 අංක 02 දරණ දුගී දුප්පත්කම දුරලීමේ අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය. — කෙටි නාමය

**02.** (I) දකුණු පළාතේ ස්වයං රැකියා උත්පාදනය හා වෙනත් සංවර්ධන අරමුණු තුළින් විරැකියාව හා දුගී දුප්පත්කම දුරලීම සඳහා (මෙහි මින් මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලක් මෙයින් ඇති කරනු ලැබේ. — අරමුදල පිහිටුවීමේ පරමාර්ථ

(II) රුපියල් ලක්ෂ සියයක මුදලක් පළාත් අරමුදලෙන් මෙම අරමුදල ආරම්භ කිරීම සඳහා එකී අරමුදලට ගෙවිය යුතුය.

**03.** පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රඥප්ති මගින් හෝ වෙනත් මාර්ග වලින් හෝ කලින්-කලට තීරණය කෙරෙන එවැනි මුදල් මෙම අරමුදලට බැර කළ යුතුය.

**04**. මෙම ප්‍රඥප්තියේ පරමාර්ථ සපුරා ගැනීම සඳහා දකුණු පළාත් සභා අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන නියෝගයක් මත ප්‍රධාන ලේකම්වරයා විසින් පළාත් සභා ලේකම්වරුන් වෙත අවශ්‍ය මුදල් ලබා දෙනු ඇත.

**05**. (I) අරමුදලේ භාරකාරත්වය ප්‍රධාන ලේකම්වරයා දරනු ඇත. — අරමුදලේ භාරකාරත්වය ප්‍රධාන ලේකම්වරයා දැරිය යුතුය

(II) අරමුදලෙන් මුදල් ඉවත්කර ගැනීම හා සම්බන්ධ හෝ ඊට අනුයාත සියළු කරුණු විධිමත් කිරීම සඳහා ප්‍රධාන ලේකම්වරයා විසින් රීති මගින් විධිමත් කළ යුතුය. — ගිණුම් රීති සැකසීම

**06**. ප්‍රතිලාභීන් තෝරා ගැනීම දකුණු පළාතේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන මණ්ඩල විසින් කළ යුතුය. — ප්‍රතිලාභීන් තෝරා ගැනීම



**07**. තෝරා ගනු ලබන ප්‍රතිලාභීන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් විසින් ඒ ඒ රැකියාවන් සඳහා තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයන් නීතිමය අවශ්‍යතාවයන් සපුරාලීමෙන් පසුව ලබා දිය හැක. — අරමුදලින් මුදල් ප්‍රමාණයක් ගෙවීම

**08**. (I) (අ) 10%කට නොවැඩි පොළියක් සමග ආපසු මුදල් ගෙවීමේ පදනමක් මත; හෝ,

(ආ) එක්වර දෙනු ලබන ප්‍රදානයන් වශයෙන්; හෝ එකී මුදල් අමාත්‍ය මණ්ඩලයේ තීරණය මත ඒ ඒ ලේකම්වරයා විසින් නිකුත් කළ යුතුය.

(II) පොළිය අඩු කිරීම, වෙනස් කිරීම හෝ අහෝසි කිරීම සහ දෙනු ලබන මුදල් ප්‍රමාණය නියම කිරීම දකුණු පළාතේ අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව විය යුත්තේය

(III) අමාතය මණ්ඩලය තීරණය කරන පරිදි;

(අ) සුදුසු අවස්ථාවන්හි දී; හෝ

(ආ) ව්‍යාපෘති ඵල දරන තෙක්; හෝ

වාරික අය කර ගැනීමේ කාලය විලම්භනය කළ හැකිය.

**09**. මෙම අරමුදල ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වනු ඇත.

**10**. ප්‍රධාන ලේකම්වරයා විසින් අරමුදලේ වාර්ෂික ගිණුම ඊළඟ වර්ෂයේ ජුනි මස 30 දිනට පෙර ඊට සම්බන්ධ විගණකාධිපතිගේ වාර්තාවේ පිටපතකුත් සමග ආණ්ඩුකාරවරයා වෙත යැවිය යුතු අතර, ඔහු විසින් එය පළාත් සභාව ඉදිරියේ තැබීමට සලස්වන්නේය.

1989 සැප්තැම්බර් මස 28 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව අනුමත වූ බව, මම මෙයින් සහතික කරමි.

පී. ඩබ්ලිව්. සෙනෙවිරත්න
සභාපති,
දකුණු පළාත් සභාව. 1989.10.04 දින